**දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2015**
**------------------------------------------------------------**

දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
---------------

2.1 මතය
-----------

2015 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ඡේදය ප්‍රකාරව අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර, අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිමාලාව අනුව මේ දක්වා එහි කටයුතු පවත්වාගෙන යමින් තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 42,450,354 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 45,622,092 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,171,738 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආදායම රු. 3,691,509 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

4.1 කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ රෙගුලාසි මාලාවේ අංක 17 හා 19 රෙගුලාසීන් ප්‍රකාරව සෑම මාසයකම දත්ත සමුදාය යාවත්කාලීන කර දිනුම් ඇදීම සිදු කළ යුතුයි. එසේ වුවද, 2012 දෙසැම්බර් 31 දිනට 1,549,524 ක් වූ පවුල් සංඛ්‍යාව යොදා ගෙන 2015 වර්ෂය වෙනුවෙන් 2016 ජනවාරි මාසයේදී දිනුම් ඇදීම සිදු කර තිබුණද, 2015 ජනවාරි හා දෙසැම්බර් මාස අතර ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව 1,477,859 ක සිට 1,453,078 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් විය.

(ආ) දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රතිලාභීන් නොවන පවුල් 107 ක් හා තොරතුරු සොයාගත නොහැකි වූ පවුල් 31 ක් වෙත දිනුම් ඇදී තිබූ රු. 20,700,000 ක් ද, වෙනත් විවිධ හේතූන් මත පවුල් 143ක් වෙත දිනුම් ඇදී තිබූ රු. 21,450,000 ක් වූ ත්‍යාග මුදලක් ද ප්‍රදානය කිරීමට නොහැකි වී තිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම රු. 653,639,810 ක් කෙටිකාලීන අයෝජනවල ආයෝජනය කර තිබීමෙන් දිගුකාලීනව ආයෝජනය කර ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී ඇති බවට නිරීක්ෂණය විය.

(ආ) අරමුදලේ කාර්යයන් සඳහා පූර්ණකාලීනව යොදවා ඇති දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ වැටුප් හා අනෙකුත් පොදුකාර්ය වියදම් රජය මඟින් දරනු ලැබුවද එම වියදම් රජය වෙත ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 04 ක කාලපමාවකින් පසුව 2020 පෙබරවාරි 27 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2** **අයවැය ලේඛනමය පාලනය**

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.